***<u>හදිසි අනතුරකට පත් රාජකීය විද්‍යාලයේ ශිෂ්‍යයාට අමාත්‍ය සජිත් ප්‍රේමදාස මහතාගේ ආරාධනයෙන් 2016.05.31 වන දින අරලියගහ මන්දිරයේ දී ගරු අග්‍රාමාත්‍යතුමා විසින් නිවසක හිමිකම් ඔප්පුව ලබාදුන් අවස්ථාවේදී දැක්වූ අදහස්.</u>***

**සසංක ශිෂ්‍යයාට හොඳ දීප්තිමත් අනාගතයක් තිබුණා. නමුත් එක් සිද්ධියකින් ඒ සියල්ලම වෙනස් වුණා. නමුත් මාපියන්ගේ වාසනාව නිසා අද සසංක ජීවතුන් අතර සිටිනවා. නමුත් ඔහු අද ජීවත් වන්නේ වෙනත් තත්ත්වයකයි. එසේ නම් මේ දක්ෂ ශිෂ්‍යයාට අනාගතයක් ඇති කර ගැනීම සඳහා අප හැකි අයුරින් උදව් ලබාදිය යුතුයි.**

**තමන් පදිංචිවී සිටි නිවස මාර්ග ව්‍යාපෘතියක් සඳහා අත්පත් කර ගැනීම නිසා ඔවුන් අසරණ බවට පත් වුණා. ඒ නිසා තමන් බලාපොරොත්තු වන මට්ටමේ නිවසක් සොයා ගැනීමට නොහැකි වුණා. ඒ අවස්ථාවේදී සජිත් ප්‍රේමදාස අමාත්‍යතුමා ඉදිරිපත් වී නිවසක් ලබාදීමට කටයුතු කළා. කිසිම ප්‍රශ්නයක් නැහැ අප හොඳ නිවසක් ලබා දෙමු යැයි සජිත් ප්‍රේමදාස ඇමැති තුමා අප සමගත් පැවසුවා. එසේ නම් අප මේ නිවස ලබා දෙන්නේ සසංක ශිෂ්‍යයා වෙනුවෙනුයි. මෙවැනි ප්‍රශ්නවලට මුහුණ දෙන අයට උපකාරී කිරීම අපේ යුතුකමක් බව කිව යුතුයි.**

**සජිත් ප්‍රේමදාස ඇමැතිතුමා මෙවැනි අසරණ වූ ජනතාව පිළිබඳ සොයා බලා කටයුතු කරනවා. එය ඔහුට පියාගෙන් උරුම වූ ලක්ෂණයක් බව මගේ හැඟීමයි. ප්‍රේමදාස ජනාධිපතිතුමාත් අසරණ වූ ජනතාව වෙත බෙහෙවින් උදව් උපකාර කළා. අපත්, අසරණවූ ජනතාවට උදව් උපකාර කළ යුතුයි.**

**<u>රට පුරා නිවාස නොමැති ජනතාවට නිවාස ලබාදීම සඳහා අදාළ අමාත්‍යවරුන් සියලු දෙනා සමග සාකච්ඡා කොට අවසන් තීරණ ලබාගැනීම සඳහා නොබෝදිනකදී රැස්වීමට නියමිතයි. කොළඹ පදිංචි බොහෝ දෙනෙකුගේ නිවාස අහිමි වුණා. ඇතැමුන් බලහත්කාරයෙන් එළියට දැම්මා. දැන් ඒ අයටත්, අනෙක් ප්‍රදේශවල සිටින ජනතාවටත් කඩිනමින් නිවාස ලබාදිය යුතුව තිබෙනවා.</u>**

**නගරයක් දියුණුවට පත් වන විට එම නගරයේ ඉඩම් අලුත් ප්‍රයෝජන සඳහා ලබා ගැනීමට සිදු වනවා. කුඩා නිවාස පැල්පත් මෙන්ම විශාල සාප්පු සංකීර්ණ පවා අලුත් ප්‍රයෝජන සඳහා යොදා ගැනීමට සිදුවන අවස්ථා තිබෙනවා. ඒවා කඩා අලුතෙන් ඉදිකරන්නට සිදු වනවා.**

**විශාල සාප්පු සංකීර්ණයක් තිබෙන පුද්ගලයකුට නම් විශාල වානිජ වන්දියක් ගෙවූ පසුව නැවත අලුතින් ව්‍යාපාරයක් ඇරඹීමට හැකියාව තිබෙනවා. <u>නමුත් කුඩා නිවසක් ඇති අයට ලැබෙන වන්දි මුදලින් තවත් නිවසක් ඉදිකිරීමට අසීරු කටයුත්තක්.</u>**

**ජේ.ආර්. ජයවර්ධන ජනාධිපතිතුමාගේ සමයේදී අප අලුත් ක්‍රමවේදයක් ඇති කළා. ප්‍රේමදාස ජනාධිපතිතුමාත් එම ක්‍රමවේදය ක්‍රියාත්මක කළා. <u>එනම් නාගරිකව කුඩා නිවාසවල පදිංචිවී සිටින</u>**

**අයට පදිංචි සහතිකයක් ලබාදීමයි. එහි පදිංචිවී සිටිය හැකි බවට එම සහතිකය කියැවුණා. නීතියෙන් එම සහතිකයට යම් වටිනාකමක් තිබිය යුතුයි. එය කොලකැබැල්ලක් පමණක් නොවේ. එය සින්නක්කර ඔප්පුවක් නොවුණත් යම්කිසි වටිනාකමක් තිබෙන ලියැවිල්ලක්.**

**මේ සියලුදේ සලකා බලා අප අලුත් වැඩසටහනක් ක්‍රියාත්මක කිරීමට කටයුතු කරනවා. දැනට තිබෙන නිවාස සැලසුම්වල ප්‍රශ්න කිහිපයක් ද පැන නැගී තිබෙනවා. ඒ ප්‍රශ්න දෙස ද අවධානය යොමු කොට කොළඹ ජනතාවට සෙතක් වන අයුරින් අලුත් නිවාස වැඩසටහන ක්‍රියාත්මක කරනවා. ඒ අතරතුර ගම්මට්ටමින් නිවාස ව්‍යාපෘති කඩිනමින් ඉදිකිරීමට මම කටයුතු කරනවා.**